# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,166- 2020 මර්තු මස 03 වැනි සිකුරාදා - 2020.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**2020 පෙබරවාරි මස 28 වැනි දින ගැසට් පත්‍රයේ පළ වූ තනතුරු ඇබෑර්තුවලින් කොටසක් මෙදින පුවත්පත් දැන්වීමේ පළ වේ.**

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව**

ආධුනික ශිෂ්‍යභට නිළධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිළධාරීන් සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී. :-

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි)
(ආ) කාර්මික ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)
(ඇ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඈ) සැපයුම් ශාඛාව (පිරිමි/කාන්තා)
(ඉ) පරිපාලන ශාඛාව (පිරිමි)
(ඊ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (පිරිමි/කාන්තා)
(උ) මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි)
(ඌ) විනයාරක්ෂක ශාඛාව (පිරිමි)
(එ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඒ) පාලන තූර්‍යවාදක ශාඛාව (පිරිමි)

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

3. **විශේෂ සුදුසුකම් (උපාධි වැඩසටහන)** :-

Bsc (Aviation Studies) උපාධි වැඩ සටහන යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිළිගත්). උපාධි සහිත වැඩසටහන සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් තම අයදුම්පත්‍රයේ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන වග ද සඳහන් කළ යුතුය.

(අ) *නියමු පොදු රාජකාරි/මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක)* ශාඛාවන් :
අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාග යෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව/ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණවේදය යන විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) *කාර්මික (ගුවන් යානා) ඉංජිනේරු/විද්‍යුත් ඉංජිනේරු ශාඛාවන්* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාග යෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) *සැපයුම්/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු/විනයාරක්ෂක ශාඛාවන්* :
අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුත අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/තාක්ෂණවේදය/කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. (විනයාරක්ෂක ශාඛාව සඳහා අයදුම් කරන්නන් හට අඩි 05 අගල් 08කට වඩා උසකින් යුක්ත වීම සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.)

(ඈ) *තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාග යෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සමග තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඉ) *පාලන තූර්‍යවාදක ශාඛාව*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සහ බටහිර සංගීතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් කලා විෂය ධාරාවෙන් බටහිර සංගීතය හා පෙරදිග සංගීතය යන විෂයයන් දෙකට සම්මාන සාමාර්ථ දෙකක්ද ඇතුලත්ව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුයි. තවද වෙනත් විෂය ධාරාවන් මගින් අ.පො.ස. (උ.පෙළ) හදරා ඇති අයවලුන් එක් වරකදී විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම සහ රාජකීය සංගීත පාසැල, ට්‍රිනිටි විද්‍යාලය ලන්ඩන්, ලන්ඩන් සංගීත විද්‍යාලයේ හෝ වෙනත් ජාත්‍යන්තරව පිළිගත් සංගීත පාසැලක 5 වන හෝ ඉහළ ශ්‍රේණියේ න්‍යායික හෝ ප්‍රායෝගික විභාගයක් සමත් වී තිබීම හෝ බටහිර තූර්ය වාදක කණ්ඩායමක/බටහිර ශිෂ්‍ය භට තූර්ය වාදක කණ්ඩායමක වසර තුනක හෝ ඊට වඩා වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි.

සුසර භාණ්ඩ (woodwind, Brass wind) සහ තාල වාද්‍ය භාණ්ඩ (Percussion) වාදනය කිරීමේ හැකියාව තිබීම, බටහිර සංගීත කණ්ඩායම් තූර්ය වාදන කණ්ඩායම් සඳහා ස්වර ප්‍රස්ථාර ලිවීමේ සහ නිර්මාණ කිරීමේ හැකියාව තිබීම, බටහිර සංගීත කණ්ඩායම්/තූර්‍ය වාදන කණ්ඩායම් පාලනය කිරීම සහ මෙහෙයවීම (Conducting) හැකියාව තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.

4. විශේෂ සුදුසුකම් (උපාධි රහිත වැඩසටහන)
නියමු පොදු රාජකාරි/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු ශාඛාවන්

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතුයි. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර)

5. විශේෂ සටහන් :- ජාත්‍යන්තර පාසල් වල ඉගෙන ගත් (Pearson/Edexcel - International Ordinary/ Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6. *අනෙකුත් සුදුසුකම්* : අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (ආ) | වයස | : | 2020 ජූලි මස 15 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | : | පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි).<br>කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි). |
| (ඈ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25<br>ශරීර ස්කන්ධ දර්ශකය = බර(කි. ග්‍රෑ.) / උස(මී) $^2$ |
| (ඉ) | පපුව | : | (පිරිමි) අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ඨිය | : | සීපී 2 |
| (උ) | දෘෂ්ඨි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිත) |
| (ඌ) | සිවිල් තත්ත්වය | : | අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේදී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. |

7. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

8. ඉහත සඳහන් 3 සහ 4 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

9. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති සුදුසුකම් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

10. *සේවා කොන්දේසි* :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව සාර්ථකව නිමවීමෙන් පසු ඔහු/ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිලධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීන් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 මාර්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

(*ආ*) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතුයි.

(*ඇ*) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන්පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(*ඈ*) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(*ඉ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුද භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(*ඊ*) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(*උ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(*ඌ*) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) සහ (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාග නු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(*එ*) තෙවන සහ සිව්වන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්‍ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉහත පරීක්ෂණයන්ගෙ න් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. තවද මෙම පරීක්ෂණයන්ගෙ න් සාර්ථකව සමත්වන්නන් ගුවන් හමුදවට බඳවා ගැනීමට ප්‍රථම පවත්වනු ලබන හුරුකරවීමේ පුහුණු සැසිවාර සඳහා සහභාගි විය යුතුවේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හිදී සහ සම්මුඛ පරීක්ෂණයන්හිදී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(*ඒ*) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(*ඔ*) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදළ පරිදි අයකරනු ලැබේ.

(*ඕ*) සියලුම නිලධාරින් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(*ක*) සියලුම නිලධාරින් ගුවන් හමුද පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

11. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

12. *වැටුප් හා දීමනා :*

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිලධාරින්ගේ සහ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ. :-

| *වර්ෂය*<br>*නිළය* | *2020 (වසරකට)* |
|---|---|
| ඔෆිසර් කැඩෙට් | 3,88,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට) | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට නොවන) | 5,02,860.00 |
| ප්ලයින් ඔෆිසර් | 5,71,380.00-(30**x**16020) =1,051,980.00 |
| ප්ලයිට් ලෙප්ටිනන් | 6,67,500.00-(24**x**16020) =1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 7,31,580.00-(22**x**16020) =1,084,020.00 |
| විංග් කමාණ්ඩර් | 7,51,140.00-(17**x**19560) =1,083,660.00 |

*ආ. අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.

(6) අතුරු දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ. (2019 වසරේ අයවැය යෝජනාවට අනුව අතුරු දීමනාව මසකට රු. 2,500.00 බැගින් වෙනස් වී ඇත.)

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා දිනකට රු. 774.37ක් ගෙවනු ලැබේ).

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමි වේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඉන් ඉහළ නිලයන්ට මසකට රු. 3,200.00 සිට රු. 8,500 දක්වා වේ.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිලය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.

(19) ඉංජිනේරු දීමනාව මසකට රු. 15,000.00ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරින් හට පමණයි)

13. *විශ්‍රාම වැටුප් /පාරිතෝෂික දීමනා.*—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරින් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

14. *අයදුම්කරුවන්ට උපදෙස් :*

(*අ*) පහත දක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට ප්‍රථම ලැබෙන සේ ''විධායක, ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත............ ශාඛාව'' යනුවෙන් සටහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් ශාඛාවකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර ශාඛාවන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්‍ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්‍ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය. :

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.),

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්,

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය),

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්,

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්,

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්,

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූපදෙකක්.

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්‍ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(*ඊ*) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

15. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

16. *තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(*අ*) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්‍ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්‍ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. ඉන් තෝරා ගනු ලබන අපේක්‍ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්‍ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඈ*) තෝරාගැනීමේ පරීක්ෂණයන් අතරතුර සියලු අයදුම්කරුවන්හට ලිඛිත, ප්‍රායෝගික හා නිලධාරි තත්ව පරීක්ෂණයන් සඳහා පෙනී සිටීමට සිදුවේ.

(*ඉ*) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්‍ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(*ඊ*) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(*උ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී
(ආරක්‍ෂක හා උපාය අධ්‍යයන),
එන්ඩීසී,පීඑස්සී,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති,
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ . . . . . . . . . . ශාඛාව**

1. පුරවැසිභාවය :—————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ස්ථිර ලිපිනය :—————.

5. තැපැල් ලිපිනය :—————.

6. උපන් දිනය :—————.
වයස : (2020 ජූලි මස 15 වන දිනට) අවුරුදු :—————. මාස :—————. දින :—————.

7. උස : සෙන්ටිමීටර් :———. (අඩි :———. අඟල් :———.)

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය :————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.
14. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
15. අධ්‍යාපනය ලැබූ පාසල :————.
16. පාසල් පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | *වෙනත් සුදුසුකම්* | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.
18. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර :-

| *මවගේ සහ පියාගේ සම්පූර්ණ නම* | *ජා.හැ.ප. අංකය* | *රැකියාව* | | *දැනට ලිපිනය* |
|---|---|---|---|---|
| | | *පෙර* | *දැනට* | |
| | | | | |
| | | | | |

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.
21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.
22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.
23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.
24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.
25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.
26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

28. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ..................... නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

* අදාළ නොවන වචන කපා හරින්න.

02-702

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව — නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරීන් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව
(ඇ) සැපයුම් ශාඛාව
(ඈ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(ඉ) වෛද්‍ය ශාඛාව
(ඊ) දන්ත වෛද්‍ය ශාඛාව
(උ) පරිපාලන නීති ශාඛාව
(ඌ) පරිපාලන පශු වෛද්‍ය ශාඛාව
(එ) පරිපාලන අධ්‍යාපන ශාඛාව
(ඒ) පරිපාලන තූර්යවාදක ශාඛාව
(ඔ) පරිපාලන විගණන ශාඛාව
(ඕ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

*මූලික අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටීම අනිවාර්ය වේ. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර).

(ආ) අ. පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (Pearson/Edexcel-International Ordinary /Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමග සැසදෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සළකා බලනු ලැබේ.

*වෘත්තීය/ශාස්ත්‍රීය සුදුසුකම් :*

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව :

(1) කාර්මික ඉංජිනේරු නිළධාරී (පර්යේෂණ නිලධාරී) -
පිරිමි (ස්වේච්ඡා)
ගුවන්යානා ඉංජිනේරු, විද්‍යුත්, විදුලි හා ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය ලබා තිබීම.

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලින් ඉහල ශ්‍රේණිගත අගයක් ලබා තිබීම.

දේශීය විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. අවසන් වසරේ නවීන ආකාරයේ ව්‍යාපෘතියක් නිමවා තිබීම සහ අදාල කේෂ්ත්‍රය පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයවළුන්ට ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ.

(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව :

(1) **විද්‍යුත් ඉංජිනේරු නිලධාරී - පිරිමි (නිත්‍ය)**
විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ විද්‍යුත්/විදුලි සන්නිවේදනය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුලත් වූ භෞතිකවිද්‍යාවේදී උපාධියක් හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ.) හෝ තාක්‍ෂණ ඉංජිනේරු ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්) ලබා තිබීම. IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) සැපයුම් ශාඛාව :

(1) **භෝජනාගාර කළමණාකරු - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ හෝටල් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය පිළිගත් ආයතනයක හදාරන ලද කාණ්ඩ 4කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික, මධ්‍යම සහ උසස් පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳව ඉහත සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

(2) ඇගළුම් තාක්‍ෂණික නිළධාරී - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

තාක්‍ෂණික හෝ ඉංජිනේරු විද්‍යාව සඳහා වූ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම, ඇගළුම් සහ රෙදිපිළි තාක්‍ෂණය සඳහා වූ පශ්චාත් උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඇගළුම් ආයතනයෙන් හෝ පිළිගත් ඇගළුම් ආයතනයකින් රෙදිපිළි හා ඇගළුම් සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ඈ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව

(1) සිවිල්/විදුලි ඉංජිනේරුවන් - පිරිමි (නිත්‍ය)

සිවිල්/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත
වූ විද්‍යාවේදී උපාධිය සහ IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ සිවිල්/විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්.එන්.ඩී.ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. (ජාතික ඩිප්ලෝමාධාරීන් හට IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ).

(ඉ) වෛද්‍ය ශාඛාව :

(1) **කායික රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් කායික රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD Medicine) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, කායික රෝග විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **ශල්‍ය වෛද්‍ය විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ශල්‍ය වෛද්‍ය විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -General Surgery) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ශල්‍ය වෛද්‍ය විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) **නිර්වින්දන විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Anesthesiology) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, නිර්වින්දන විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(4) **ළමා රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ළමා රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Pediatric) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ළමා රෝග විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(5) **ප්‍රසව හා නාරිවේද විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය විද්‍යාව (Ms-Gynecology and Obstetrician) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ප්‍රසව හා නාරිවේද විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

***විශේෂ සටහන්.***-විශේෂඥ වෛද්‍යවරුන් සඳහා 2020 ජූලි මස 15 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි. නමුත් වයස අවුරුදු 40ට වැඩි විශේෂඥ වෛද්‍යවරුන්, විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් හා පළපුරුද්දක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි (විංග් කමාණ්ඩර් නිළය සඳහා) ඔහු/ඇය බඳවා ගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඊ) *දන්ත වෛද්‍ය ශාඛාව* :

(1) **දන්ත වෛද්‍ය නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන පිළිගත් විදේශ දන්ත වෛද්‍ය උපාධියක් තිබීම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)**

දන්ත වෛද්‍ය සිසුන් බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) විශ්ව විද්‍යාල වර්ෂාර්ධය (semester) අටක් (8) සම්පූර්ණ කර තිබීම හෝ විදේශ දන්ත වෛද්‍ය විද්‍යාලයකින් සමත් වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්යයෙන් ම ලබා තිබිය යුතුය. තව ද වෛද්‍ය සභාවේ ස්ථිර හෝ තාවකාලික ලියාපදිංචිය හිමි හෝ අහිමි සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවාගනු ලබන අතර බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතුය.

(උ) *පරිපාලන නීති ශාඛාව* :

(1) **නීති නිලධාරී - පිරිමි/කාන්තා (නිත්‍ය)**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකුවීම. නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (3) කාලයක් මහේස්ත්‍රාත් අධිකරණයේ, දිසා අධිකරණයේ මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තුළ නඩු කටයුතු මෙහෙයවා තිබීම, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් වාණිජ ගිවිසුම් සැකසීම පිළිබඳ පළපුරුද්ද, නොතාරිස් කටයුතු පිළිබඳ ලේඛණ සැකසීම, අවබෝධතා ගිවිසුම් සහ මිලදී ගැනීමේ ලේඛණ සැකසීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සහ පරිඝණක යතුරු ලිවීම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

(ඌ) *පරිපාලන පශු වෛද්‍ය ශාඛාව*

(1) පශු වෛද්‍ය නිළධාරි - පිරිමි (නිත්‍ය)
පශු වෛද්‍ය සහ සත්ව විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම.

(එ) **පරිපාලන අධ්‍යාපන ශාඛාව :**

(1) **ඉංග්‍රීසි භාෂා උපදේශක - පිරිමි /කාන්තා (නිත්‍ය/ ස්වේච්ඡා)**

පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සමඟ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම හෝ ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම හෝ අධ්‍යාපනවේදී ඩිප්ලෝමාවක් හදරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම. පිළිගත් ආයතනයක අවම වශයෙන් වසරක ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස සේවා පළපුරුද්දක් තිබීම හෝ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි ගුරු අභ්‍යාස පාඨමාලාවක් (මාස 06කට නොඅඩු) හදරා තිබිය යුතුයි;

*හෝ*

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක (3) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීම හෝ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක (2) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස හැදෑරීම හෝ රජයේ හෝ රජය විසින් පිළිගත් විදේශ ආයතනයක වසර තුනක (3) ගුරු අභ්‍යාස පුහුණුවක් සාර්ථකව නිම කර තිබීම.

(2) **ප්‍රංශ සහ චීන භාෂා උපදේශකයන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ වසරක (1) ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම සහ රජයේ හෝ රජය විසින් පිළිගත් ආයතනයක වසර තුනක (3) ප්‍රංශ/චීන භාෂා ගුරුවරයෙකු ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

(ඒ) **පරිපාලන තූර්ය වාදක ශාඛාව**

(1) තූර්ය වාදක පාලක - බටහිර සංගීත (මිලිටරි තූර්යවාදක කණ්ඩායම) - පිරිමි (නිත්‍ය)

බටහිර සංගීතය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ බටහිර සංගීතය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ රාජකීය සංගීත පාසල, ට්‍රිනිටි විද්‍යාලය ලන්ඩන්, ලන්ඩන් සංගීත විද්‍යාලයේ හෝ වෙනත් ජාත්‍යන්තරව පිළිගත් සංගීත පාසලක 5 වන හෝ ඉහල ශ්‍රේණියේ න්‍යායික හෝ ප්‍රායෝගික විභාගයක් සමත් වී තිබීම.

(ඔ) **පරිපාලන විගණන ශාඛාව**

(1) අභ්‍යන්තර විගණන නිලධාරින් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී/ කළමණාකරණ/ගණකාධිකරණ හෝ ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයේ උපාධියක් සමග පහත සඳහන් වෘත්තිය සුදුසුකම් වලින් එකක් හෝ වැඩි ගණනක් සපුරා තිබීම.

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරි (CBA) සහතිකය හෝ එයට සමාන එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CMA) සුදුසුකම් සපුරා තිබීම හෝ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරි සංගමයේ (APFA) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

(ඕ) **තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව :**
(1) **ජාල කළමණාකාර නිලධාරීන් - පිරිමි /කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග දත්ත ජාලකරණය හෝ ජාලකරණ පද්ධතිය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(2) **මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග C#,ASP. Net 4.0 and above, WCF,MVC 5, Entity Framework, LINQ, Angular, Visual Studio 2015, Team Foundation Server (TFS), NET Core, Python, Big data analysis tools or MS SQL පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) තොරතුරු/වෙබ් අවකාශ ආරක්ෂක විශේෂඥයින් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිඝණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිඝණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග තොරතුරු/වෙබ් අවකාශ සුරක්ෂිතතාවය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(4) වෙබ් අඩවි නිර්මාණකරුවන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

පරිගණක ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක්/තොරතුරු තාක්‍ෂණ විද්‍යාවේදී උපාධියක්/පරිගණක විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පරිගණක ඉංජිනේරු විද්‍යාවේ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්.) ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග වෙබ් අඩවි නිර්මාණකරුවන් සඳහා වෙබ් අඩවි නිර්මාණය පිළිබඳව වගකීමක් සහිත හසල දැනුමක් සහ HTML/XHTML/HTML 5, CSS (Cascade Style Sheet) JavaScript, JQuery, flash action script, PHP, MySQL, ASP.NET,MSSQL පිළිබඳව මනා දැනුමක් තිබීම ආදිය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. ***පළපුරුද්ද.***-ඉහත සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම තෝරාගැනීමේදී අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

4. *අනෙකුත් සුදුසුකම්* :

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (ආ) | සිවිල් තත්ත්වය | : | විවාහක/අවිවාහක |
| (ඇ) | ස්ත්‍රී පුරුෂ භාවය | : | පිරිමි/කාන්තා (අදාළ පරිදි) |
| (ඈ) | වයස | : | 2020 ජූලි මස 15 වැනි දිනට අවුරුදු 18 සිට 33 දක්වා |
| (ඉ) | උස | : | **පිරිමි** - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6) ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 165.0<br>(අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය.<br><br>**කාන්තා** - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුයි.<br>වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 160.0<br>(අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| (ඊ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 |

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^{2}}$$

| | | | |
|---|---|---|---|
| (උ) | පපුව | : | අඟල් 32" ට නොඅඩු විය යුතුයි. (පිරිමි) |
| (ඌ) | වර්ණ දෘෂ්ඨිය | : | සීපී 2 |
| (එ) | දෘෂ්ඨි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිතව)<br>(වෛද්‍ය හා දන්ත වෛද්‍ය ශාඛාවල අපේක්‍ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ඨි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම්, එය උපැස් සහිතව 6/6 තත්ත්වයට තිබීම අනිවාර්ය වේ.) |

5. ***විශේෂ සටහන්*** :

(1) ඉහත සඳහන් 2, 3 සහ 4 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

(2) තෝරාගනු ලබන අපේක්‍ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි, ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිලයන්හි අධිකාරියට පත්කරනු ලැබේ.

(3) තෝරා ගනු ලබන සියලුම අපේක්‍ෂකයින්හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිළධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

(4) තෝරාගනු ලබන සියලුම අපේක්‍ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(5) සියලුම උපාධින් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතුය.

(6) යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(7) ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්‍ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

(9) තෝරාගනු ලබන අපේක්‍ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

(10) 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව ''සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක'' කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

(11) ගුවන් හමුදා නිලධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

(12) විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරින් පාලනය කරනු ලැබේ.

(13) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(14) විවාහක නිලධාරින්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරින් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 6.ඉ.(11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

06. *වැටුප් හා දීමනා* :

*අ.* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

| *වසර* / *නිලය* | *2020 (වාර්ෂිකව)* |
|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | 5,02,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 5,71,380.00- (30 x 16,020) = 10,51,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 6,67,500.00-(24 x 16,020) = 10,51,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 7,31,580.00-(22 x 16,020) = 10,84,020.00 |
| විංග් කමාන්ඩර් | 7,51,140.00-(17 x 19,560) = 10,83,660.00 |

*ආ.* වෛද්‍ය නිලධාරින්ගේ වැටුප් :

| *වසර* / *ශ්‍රේණිය* | *2020 (වාර්ෂිකව)* |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 6,51,480.00 (2 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) = 12,52,260.00 |
| 2 වන ශ්‍රේණිය | 6,99,660.00 (6 x 16,140-2 x 19,560-16 x 26,040) = 12,52,260.00 |
| 1 වන ශ්‍රේණිය | 8,61,660.00 (15x26,040) =12,52,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 10,56,000.00 (12 x 32,400) =14,44,800.00 |

*ඇ.* දන්ත වෛද්‍ය නිලධාරින්ගේ වැටුප් :

| *වසර* / *ශ්‍රේණිය* | *2020 (වාර්ෂිකව)* |
|---|---|
| 2 වන ශ්‍රේණිය | 6,35,460.00 (3 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) = 12,52,260.00 |
| 1 වන ශ්‍රේණිය | 8,61,660.00 (15x26,040) =12,52,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 10,56,000.00 (12 x 32,400) = 14,44,800.00 |

*ඈ.* අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරින් සඳහා :

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 2,125.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 400.00 (මසකට) |

(3) විවේක කාල රාජකාරි බටා
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරි දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 687.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 796.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 1,101.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 1,302.00 (පැයකට) |

(5) භාෂා ප්‍රවීණතා දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,485.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,495.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 2,320.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 2,850.00 (මසකට) |

(6) ඉ (18) ඡේදයේ දක්වෙන සේවා දීමනා අදළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඉ) *අනෙකුත් දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ. (2019 වසරේ අයවැය යෝජනාවට අනුව අතුරු දීමනාව මසකට රු. 2,500.00 බැගින් වෙනස් වී ඇත.)

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිළයන් සඳහා මසකට රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා

(12) දුරකතන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට එයාර් වයිස් මාර්ෂල් නිළය දක්වා මසකට රු. 2,500 සිට රු. 5,000 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/ බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිළ ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිළධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)

(21) අමතර රාජකාරි ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) දුරකතන බිල් දීමනාව

| | |
|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරි | - රු. 8,000.00 (මසකට) |
| වෛද්‍ය නිලධාරි | - රු. 4,000.00 (මසකට) |

7. ***විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.***—විටින් විට සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව ය.

8. ***ඉල්ලුම්කරුවන්ට උපදෙස්*** :

(අ) පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින මධ්‍යාහ්න 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකුල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.)

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින්

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්.

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිළධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූප දෙකක්

(ඈ) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

9. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි වීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

10. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය* :

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම, එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (ආරක්ෂක හා
උපාය අධ්‍යයන), එන්ඩීසී, පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ඉල්ලුම් කරන ශාඛාව :————.
5. ඉල්ලුම් කරන තනතුර :————.
6. ස්ථිර ලිපිනය :————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
8. තැපැල් ලිපිනය :————.
9. විද්‍යුත් ලිපිනය :————.
10. උපන් දිනය :————.
වයස : (2020 ජූලි මස 15 දිනට) අවුරුදු :————., මාස :————., දින :————.
11. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . (අඩි :——— අඟල් :———.)
12. දිස්ත්‍රික්කය :————.
13. ඡන්ද කොට්ඨාසය :————.
14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය :————.
15. දුරකථන අංක :————.
16. විවාහක හෝ අවිවාහක බව :————.
17. අධ්‍යාපනය ලැබූ පාසල :————.
18. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.
20. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *ජා.හැ.ප. අංකය* | *රැකියාව* | | *දැනට ලිපිනය* |
|---|---|---|---|---|
| | | *පෙර* | *දැනට* | |
| පියා : | | | | |
| මව : | | | | |

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.
23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.
24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.
25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.
26. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.
27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.
28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

02-703

---

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

***මූලික අධ්‍යාපන සුදුසුකම්*** :-

2. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

***වෘත්තිය සහ අදාළ අධ්‍යාපන සුදුසුකම්*** :

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් වේ :-

*අ.* ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) :

(1) ගුවන්යානා සැකිලි ශිල්පී (Aircraft Structural Technician)
(2) ගුවන්යානා යන්ත්‍ර ශිල්පී (Aircraft Engine Technician)
(3) ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී (Aircraft Electrical and Instrument Technician)
(4) ගුවන්යානා ආරක්ෂක උපකරණ ශිල්පී (Aircraft Safety Equipment Technician)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත්ව ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

තව ද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු පාඨමාලාවන් සමත් සහතිකයක් තිබෙන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

*ආ. සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)* :

(1) අවි ආයුධ ශිල්පී
(2) රථවාහන කාර්මික ශිල්පී
(3) මතුපිට කාර්මික ශිල්පී
(4) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(5) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී
(6) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී
(7) ගුවන්යානා ගිනියම් පැස්සුම් ශිල්පී
(8) ගුවන් ඡායාරූප ශිල්පී
(9) ලියවන පට්ටල් ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(10) රථ වාහන ක්‍රියාකරු (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. රියැදුරු බලපත්‍රය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ඇ*) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්* (පිරිමි)

(1) ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(3) දුරකථන ක්‍රියාකරු
(4) ගුවන් විදුලි සංනිවේදක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(*ඈ*) වෛද්‍ය වෘත්තීන් :

(1) හෙද සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ.) විභාගයෙන් විද්‍යා/ගණිත විෂය ධාරාවෙන් පහත දැක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහයක වෘත්තිය යටතේ) අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | |
|---|---|
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යා** යන විෂයයන්ගෙන් 3ක් හදාරා සියලුම විෂයයන් එක් වරකදී සමත්ව තිබීම. | - හෙද ඩිප්ලෝමාව (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය / භෞතික විද්‍යාව** යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් හා **රසායන විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - ඖෂධවේදී (පිරිමි/කාන්තා)<br>- රසායනාගාර කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ.) **රසායන විද්‍යාව/භෞතික විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, **ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා)<br>- විද්‍යුත් නිකරපණ රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා) |

| | |
|---|---|
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, **ජීව විද්‍යාව,** භෞතික විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | -විකිරණ ශිල්පී (පිරිමි/කාන්තා)<br>-අක්ෂි තාක්ෂණවේදී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා.පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය** සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | - සෞඛ්‍ය පරීක්ෂක (පිරිමි) |

(ඉ) *දන්ත සහයක (පිරිමි/කාන්තා)* :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව/ භෞතික විද්‍යා විෂය ධාරාව සහ තාක්‍ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) *පරිපාලන වෘත්තීන්* :

(1) පරිපාලන සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ,ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) *මෙහෙයුම් වෘත්තීන්* :

(1) මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) (පිරිමි) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) *ගිනි නිවන්නා (පිරිමි)* :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) *මෙහෙයුම් භූමි (පිරිමි/කාන්තා)* :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඌ) *සැපයුම් වෘත්තීන්* :

(1) සැපයුම් සහායක (පිරිමි/කාන්තා)
(2) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) *සලාක සහයක (පිරිමි)* :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) *භෝජනාගාර සහයක (පිරිමි/කාන්තා)* :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. ආගන්තුක සත්කාර ක්‍ෂේත්‍රයේ පාඨමාලාවක් හදරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(5) ගුවන් යානා කාර්ය මණ්ඩල සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමේ හැකියාවක් තිබීම සහ ප්‍රියමනාප පෙනුමකින් යුක්ත වීම අනිවාර්යවන අතර, ගුවන් සේවකයකු/ගුවන් සේවිකාවක ලෙස පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (ඇඟිලි තුඩුවලින් සිට ගත් විට සෙන්ටි මීටර් 212 ක උසක් දක්වා තම දෑත් යොමු කළ හැකි විය යුතුය.)

(6) *නිල ඇඳුම් පරිස්කාරක (පිරිමි/කාන්තා)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අධිවේගී මහන මැෂින් ක්‍රියා කරවීමේ හැකියාව (Over Lock, Button Hole, Button Attche, Double Needle, Bar Tack ) ද පතුරම් රහිතව මිම් අනුව මෝස්තර නිර්මාණය කිරීමේ හැකියාව, ඇඳුම් කැපීම සහ මහන මැෂින් පිළිබඳ කාර්මික දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(එ) *පොලිස් (පිරිමි/කාන්තා)* :
සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8 ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6 ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(ඒ) *ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි)* :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ක්‍රීඩාවලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

4. *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන වෘත්තීය සුදුසුකම්* :

(අ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) :

(1) ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණ කාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්) පාඨමාලා සහතිකයක් තිබිය යුතුය. ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) සහතිකය තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.

(ආ) *සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)*

(1) රථවාහන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*සහ*

මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා වසරක පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ දෙවසරක් හෝ ඊට වඩා වැඩි අර්ධ කාලීන පාඨමාලාවක් රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක හදරා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක දෙවසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද හෝ මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා හය මාසික පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ වසරක් හෝ ඊට වඩා වැඩි අර්ධ කාලීන පාඨමාලවක් රාජ්‍ය හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක හදරා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක තෙවසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද හෝ NVQ level III හෝ ඊට ඉහළ සහතිකයක් මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක වසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්දක් ලබා තිබීම.

(2) *මතුපිට කාර්මික ශිල්පී (රසායනාගාර කාර්මික ශිල්පී)* (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තව ද අ. පො. ස. (උ.පෙළ) විභාගය රසායන විද්‍යාව සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ භෞතික විද්‍යාව/ජීව විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අ.පො.ස. උ. පෙළ හදරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

විද්‍යුත් ලෝහ ආලේපනය පිළිබඳ මාස 6ක පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක වසරක අර්ධ කාලීන පාඨමාලාවක් හදරා තිබීම සහ පිළිගත් ආයතනයක වසරක පළපුරුද්ද හෝ අදළ ක්ෂේත්‍රයක NVQ level II සහතිකය සමග සේවා පළපුරුද්දක් තිබීම. ඉහත මූලික හා උසස් අධ්‍යාපන සුදුසුකම් සමග ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හෝ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ (IDB) හෝ වෙනත් ඕනෑම පිළිගත් ආයතනයක පුහුණුවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) **පරිගණක කාර්මික ශිල්පී (පිරිමි)** :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

පරිගණක පුහුණුව පිළිබඳ මාස 06 ක පූර්ණ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග සහ මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම; හෝ පරිගණක පුහුණුව පිළිබඳ මාස 12 ක අර්ධ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග හා මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම.

5. *අනෙකුත් සුදුසුකම්* :

අ. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වෙච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්‍ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

| | | | |
|---|---|---|---|
| (1) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි; |
| (2) | සිවිල් තත්ත්වය | : | නිත්‍ය - අවිවාහක<br>ස්වේච්ඡා හා ඉඳුරාම බඳවා ගැනීම - විවාහක/අවිවාහක |
| (3) | වයස | : | 2020 ජූලි මස 15 වැනි දිනට<br>*නිත්‍ය*<br>පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර<br>කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර<br><br>*ස්වෙච්ඡා*<br>පිරිමි - අවුරුදු 18ත් 30ත් අතර<br>කාන්තා - අවුරුදු 18ත් 28ත් අතර<br><br>*ඉඳුරාම බඳවාගැනීම්*<br>පිරිමි- අවුරුදු 18-28ත් අතර<br>කාන්තා - අවුරුදු 18-26ත් අතර |
| (4) | උස | : | අඩි 5 යි අඟල් 5ට (165cm) නොඅඩු විය යුතුයි; (පිරිමි)<br>අඩි 5 යි අඟල් 3ට (160.2 cm) නොඅඩු විය යුතුයි; (කාන්තා) |
| (5) | බර | : | 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි) ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$<br>17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා) |
| (6) | වර්ණ දෘෂ්ටිය | : | සිපි 2 ($CP_2$) |
| (7) | දෘෂ්ටි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත) |
| (8) | පපුව | : | අඟල් 32ට නොඅඩු විය යුතු ය. (පිරිමි) |

(9) *සිවිල් තත්ත්වය* :

(*අ*) නිත්‍ය ගුවන් හටයින්/ ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ක් ගතවනතුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළැඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(*ආ*) අවිවාහක වයස අවුරුදු 25ට වැඩි බඳවා ගන්නා ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවනතුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(*ඇ*) අවිවාහක ඉඳුරාම සහ ස්වේච්ඡා බඳවා ගන්නා ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවනතුරු මෙන්ම මූලික පුහුණු පාඨමාලාව නිමකරන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(*ඈ*) නර්ථන ශිල්පිනී වෘත්තියේ ගුවන් කාන්තාවන් සඳහා මූලික පුහුණු පාඨමාලාව හදාරා වසර පහක (5) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

6. දෙවන, තුන්වන, හතරවන සහ පස්වන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පස්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්‍ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්‍ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

7. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. ***සේවා කොන්දේසි*** :

(*අ*) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති

වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු/ඇය වෘත්තියේ ගුවන්භටයෙකු/ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුට ම සියලු ම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) පළමුවන ඡේදයේ සිට හතරවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන්, ගුවන්භට/ගුවන් කාන්තා නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

09. ***බඳවා ගැනීමේ කොන්දේසි*** :

(අ) *නිත්‍ය ගුවන් භටයින්/නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා*

(1) තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ආ) ස්වේච්ඡා ගුවන් භටයින්/ස්වේච්ඡා ගුවන් කාන්තාවන් සඳහා

(1) තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට නිලයට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

10. ***රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්*** .— තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

11. *වැටුප් හා දීමනා* :

(අ) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භටයින්ට අදාළ මූලික වැටුප සහ දීමනා පරිමාණ පහත සඳහන් පරිදි වේ. :

| *නිලය* | *මූලික වැටුප* | *අනෙකුත් දීමනා* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප* |
|---|---|---|---|
| ගුවන්භට | 29,540.00 | 12,150.00 | 41,690.00 |
| නායක ගුවන්භට | 30,440.00 | 12,150.00 | 42,590.00 |
| කෝප්‍රල් | 31,340.00 | 12,150.00 | 43,490.00 |

12. ***ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස්*** :

(අ) පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ ක යුතුයි. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පතේ ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා ගුවන් හමුදවේ නිත්‍ය/ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කල යුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තිය පුහුණු පාසල වෙත ලැබුනා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ අයදුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පතේ ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) ජාතික හැඳුනුම්පත සහ ඡායා පිටපත;

(3) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(7) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්

(8) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අඟල් 2 x 2 1/2 වර්ණ ඡායා රූපයක්.

(ඈ) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් කිසිවක් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

14. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

15. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුය. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර, වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

16. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහි ලා බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේ ය.

17. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

18. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී
(ආරක්ෂක හා උපාය අධ්‍යයන),
එන්ඩීසී, පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ………… වෘත්තීය සඳහා ගුවන්භට /ගුවන් කාන්තා අයදුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. තැපැල් ලිපිනය :————.
6. උපන් දිනය :————.
වයස : (2020 ජූලි මස 15 දිනට) අවුරුදු :————. මාස :————. දින :————.
7. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . (අඩි :——— අඟල් :———.)
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය :————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.
14. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
15. අධ්‍යාපනය ලැබූ පාසල :————.
16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

17. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| පියා :<br>මව : | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇග බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

28. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

(*අ*) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ………………… නැමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වෙච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :……………………………………………
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :……………………………………………
……………………………………………

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :……………………………………………
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :……………………………………………
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :……………………………………………
……………………………………………

————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ
අත්සන.

* අදළ නොවන වචන කපා හරින්න.

02-701

---

# තනතුරු ඇබෑර්තු

## 2020 මාර්තු මස 06 වැනි දින ගැසට් පත්‍රයට අදාළ තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මුදල් , ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019/2020**

ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ "මුදල් පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්" වේ. "සේවය" යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන්හිදී "ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය" වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

*විභාග දිනය* :- මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 ජුනි මස කොළඹ නගරයේ දී පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

3. පත්කරනු ලබන සංඛ්‍යාව 71 කි. පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි* :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1804/50 සහ 2013.04.05 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම ස්ථිර කරන ලද නිලධාරියකු පත්කරනු ලැබුවහොත් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත. ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගත යුතුය.

5. *වැටුප් පරිමාණය*.-2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895/- (SL-01-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(*අ*) (i) ශ්‍රී ලංකා පුරවැසියකු වීම;

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;

(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික හා අන් සෑම අයුරකින්ම යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(iv) යම් ආගමික නිකායක පූජකවරයක් දරන තැනැත්තකු නොවිය යුතුය.

(v) විවෘත තරග විභාගය සඳහා වාර දෙකකට (02) වඩා පෙනී නොසිටිය යුතුය. (පෙර සේවා ව්‍යවස්ථාව යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ II/II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)

(vi) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් පිරිනමනු ලබන පළමුවන හෝ දෙවන පන්තියේ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම;

*හෝ*

(iii) වරලත් ගණකාධිකාරීවරයෙකු වීම.

***සටහන*** :- I, II, III සුදුසුකම් බලපවත්නා දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

(ඇ) *වයස* :

අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු විසිඅට (28) ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1998.04.06 වැනි දින හෝ ඊට පෙර හා 1992.04.06 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස අවුරුදු 35 වේ.

7. *බඳවා ගැනීමේ ක්‍රමය* :

7.1 *ලිඛිත විභාගය* :
පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අවබෝධය | 100 | 40 |
| 2. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 3. සාමාන්‍ය දැනීම | 100 | 40 |

7.1.1 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-

**විෂයය අංක 01 - අවබෝධය**
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.

**I වැනි කොටස**
මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.

**II වැනි කොටස**
භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨ කිහිපයකින් දෙවෙනි කොටස සමන්විත වේ. මෙම පාඨ ආශ්‍රයෙන් ඒවායේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ යටින් ඉරි ගැසූ පද පිළිබඳ විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්ප කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු කිහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස හෝ අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(කාලය පැය 02 යි, ලකුණු 100)

**විෂය අංක 02 - බුද්ධි පරීක්ෂණය**
අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළැඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(කාලය පැය 01 යි, ලකුණු 100)

**විෂය අංක 03 - සාමාන්‍ය දැනීම**

මෙම ප්‍රශ්න පත්‍රය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව අපේක්ෂකයා තුළ ඇති දැනීම පිරික්සීම සඳහා ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(කාලය පැය 02 යි, ලකුණු 100)

7.2 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන්නේ ලිඛිත විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ පසුව වන අතර, මෙහි දී ලකුණු ලබා දීමක් සිදු නොවේ.

(iii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

(iv) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු හතළිහ (40) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙල හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා

කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත පරිදි තීරණය කරනු ලබන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

*සැලකිය යුතුයි* :

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

7.3 පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු ප්‍රමාණය අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙලින් මෙම සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8. *විභාග මාධ්‍යය* :-

(*අ*) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පවත්වනු ලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය හෝ වෘත්තීය සුදුසුකම් ලබාගත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.

(*ඇ*) අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(*ඈ*) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

***සටහන*** :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම්ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6 (ආ) ඡේදයේ ඇති උපාධි හෝ වෘත්තීය සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(iii) තම ඉල්ලුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

9. *විභාග කොන්දේසි* :-

(i) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද යතුරු ලියනය කරන ලද ඉල්ලුම් පත්‍ර ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමුවන පිටුවේ ද, 3.0 සිට 6.0 තෙක් එහි දෙවැනි පිටුවේ ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(ii) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් **2020.04.06** වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019" (2020) ලෙස විභාගයේ නම ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍යය වේ.

(iii) විභාගය සඳහා වූ ගාස්තුව රුපියල් 1,200.00කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට **විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර** කිරීම සඳහා ගෙවිය යුතුය. තැපැල් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

(iv) ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චය-කරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන්ගේ අත්සන තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සහතික කරනු ලැබිය යුතුය.

(v) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(vi) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(vii) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාග යට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද (අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද) සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(viii) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාග යට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම, තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතුය. සෑම අපේක්ෂකයෙකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

***සටහන*** : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිග ැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව : විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයන් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(*අ*) ජාතික හැඳුනුම්පත;

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(*ඇ*) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාගශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. *ගැසට් නිවේදනයේ* 7.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයින් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාග යට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* .- අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු හෝ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.

2020 ජනවාරි මස 08 වැනි දින,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2019/2020**

Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Inland Revenue Service - 2019/2020

**ඉල්ලුම්පත්‍රය**

1.0 මාධ්‍ය -
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ : GUNAWARDHANA H. M. S. K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :-
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

2.7 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

2.8 ජන වර්ගය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

2.9 ජාතික හැඳුනුම්පත් අංකය :

2.10 උපන් දිනය වර්ෂය : මාසය : දිනය :

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2020.04.06 දිනට වයස :

අවුරුදු : මාස : දින :

2.12 දුරකතන අංකය :

3.0 (i) උපාධිය/වෘත්තීය සුදුසුකම ලද දිනය :————.
(ii) විශ්වවිද්‍යාල/ආයතනය :————.
(iii) ලියාපදිංචි වූ අංකය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) උපාධිය/වෘත්තීය සුදුසුකම :————.
(vi) විෂයයන්/විෂයය ක්ෂේත්‍රය :————.
(vii) පන්තිය :————.
(viii) ඉහළ/පහළ :————.
(ix) විභාග අංකය :————.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් :

(i) දැනට දරන තනතුර හෝ සේවය :————.
(ii) ශ්‍රේණිය :————.
(iii) එම තනතුරට බැඳුනු දිනය :————.
(iv) තනතුරෙහි ස්ථිර කරන ලද දිනය :————.
(v) සේවා කාලය :————.

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

(ලදු පත නොගැළවෙන සේ මෙහි අලවන්න.)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.0 *අයදුම්කරුගේ සහතිකය* :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ........................ හා ............................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතු ය.)*

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................................................. .......... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ........ .................................................................. දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

8.0 *ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................... (සම්පූර්ණ නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............................ ..................................... සේවයේ .......................ශ්‍රේණියේ ස්ථිර තනතුරක සේවය කරන බවත්, ඔහු/ඇය මොනම ආකාරයක විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන).

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

03-32

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2020)

## First Efficiency Bar Examination for Senior Statisticians/Statisticians in the Department of Census and Statistics - 2014 (2020)

01. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2020 ජුනි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

03. *විභාග ගාස්තු* :
විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර කීපයක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගය සඳහා හෝ එක් විෂයයක් හෝ විෂයයන් කීපයක් සඳහා හෝ මුල්ම වතාවට පෙනී සිටින අපේකෂකයින්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 600 ක විභාග ගාස්තුවක් ද, විෂයන් දෙකක් හෝ ඊට වැඩිනම් හෝ සම්පූර්ණ විභාගය සඳහා ම නම් රු. 1,200 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිඳු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත්* :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020.04.03 වන දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :
විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීමට අදාළ නම්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර විමසා සිටීම ප්‍රතිඵලදායී වනු ඇත.

07. විභාගය සඳහාවන ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිය ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. එමෙන්ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ගෙන් පළමුවර විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ. තමාට නියමිත විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතු අතර, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත් වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් තුළින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, අදාළ තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

11. *විභාග පටිපාටිය* :

ඉහත තනතුරට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. පරිපාලනය | පැය 02 | 100 | 40% |
| 2. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 02 | 100 | 40% |
| 3. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40% |
| 4. ව්‍යවහාරික සංඛ්‍යානය | පැය 03 | 100 | 40% |

(01) පරිපාලනය (විෂයය අංක 01)

I කොටස - පරිපාලනය

II කොටස - කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.
VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

- *ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය* :

(*a*) එක් කොටසකට ප්‍රශ්න හතර බැගින් ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.

(*b*) I හා II කොටස්වලින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(*c*) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(02) රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංක 02) මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද මත සැකසේ.

I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4 සහ 6 වන වගන්ති

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :

(a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න හයකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
(b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
(c) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(03) ඉංග්‍රීසි (විෂයය අංක 03)
English Grammar
A suitable level of proficiency on the following forms of grammar in spoken and written language is expected from the candidate.
- Tense and Number
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

*Writing Skills* :
The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal modes of Communication
- Formal Correspondences skills
- Writing Descriptions/Explanations
- Summary writing skills
- Report Writing Skills
- Minutes of Meeting/Agendas/Invitations
- Comprehension

*Reading skills* :
Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/ written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of the printed text
* Reading and interpretation (Verbal/written)
* Understanding the cohesion and coherence of a passage.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :

(a) ප්‍රශ්න පත්‍රයේ පහත කරුණු සම්බන්ධ ප්‍රශ්න අඩංගු වේ.
 (i) ව්‍යාකරණ
 (ii) අවබෝධය
 (iii) වාග්මාලාව
 (iv) රචනා

(b) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.

(04) ව්‍යවහාරික සංඛ්‍යානය (විෂයය අංක 04)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, කෘෂිකර්ම සංඛ්‍යාති, ජාතික ගිණුම්, තොරතුරු තාක්‍ෂණ (දත්ත සැකසුම්), නියැදි සමීක්‍ෂණ, ජන සංගණන හා ප්‍රජා විද්‍යා, මිල දර්ශකාංග හා සිතියම් යන අංශ මඟින් සිදුකරනු ලබන සංඛ්‍යානමය කාර්යයන් පිළිබඳව අදාළ නිලධාරීන්ගේ දැනුම ඇගයීම පිණිස සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :
 (a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න අටකින් සමන්විත වේ. ප්‍රශ්න, ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
 (b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

11.1 එක් එක් විෂයයයෙන් සාමාර්ථය ලැබීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතු අතර, කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීම සඳහා සෑම විෂයයකින්ම සාමාර්ථය ලැබිය යුතු ය. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිපවරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්‍ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

### ආදර්ශ අයදුම්පත්‍රය

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014(2020)***

First Efficiency Bar Examination for Senior Statisticians/Statisticians in the Department of Census and Statistics - 2014 (2020)

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. සේවා ස්ථානය හා ලිපිනය :
2.1 සේවා ස්ථානයේ නම :————————————.
2.2 රාජකාරි ලිපිනය :————————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

3.3 උපන් දිනය :

වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.4 ජංගම දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. ඔබ ඉදිරිපත් වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් :

(ගැසට් නිවේදනයේ 10 වන ඡේදය බලන්න.)

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

05. දැනට දරන තනතුර :
5.1 පත්වීම් ලිපියේ අංකය :————.
5.2 පත්වීම් දිනය :————.

06. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

6.1 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේනම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
6.2 ලදුපත් අංකය :————.
6.3 දිනය :————.

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි). (ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම :*

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක වන මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය ..........................දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

03-411

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2020)**
Second Efficiency Bar Examination for Grade I Statistical officers in the Department of Census and Statistics - 2014 (2020)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2020 ජුනි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

03. *විභාග ගාස්තු :*

විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට හෝ පළමු වරට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500 විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත :*

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2020 අප්‍රේල් මස 03 වැනි දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින දිනයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති ප්‍රථම වතාවට විභාගයට පෙනීසිටින අයදුම්කරුවන්ට විභාගයටම පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.1. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිපවරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹදී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත :-

| විෂයය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➤ මේ සඳහා ආයතන සංග්‍රහයේ XV,XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(*a*) මුළු ප්‍රශ්න ගණන 05 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් යුක්ත වන අතර, අනෙක් ප්‍රශ්න හතර ව්‍යුහගත රචනා/ රචනා වර්ගයේ ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>(*b*) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. :<br>(*a*) i වන පරිච්ඡේදය, ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා) සහ ඒවායේ සියළුම සංශෝධන පිළිබඳවද අවධානයට ගත යුතුය. |
| | | (*b*) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සියළුම සංශෝධන පිළිබඳවද අවධානයට ගත යුතුය.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය*<br>(*c*) මුළු ප්‍රශ්න ගණන 05කි. I වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් යුක්ත වන අතර අනෙක් ප්‍රශ්න හතර ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ සමන්විත වේ.<br>(*d*) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

*සටහන -*

➤ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
➤ නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදන කරුණු බලපැවැත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක : 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014(2020)***
Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2014 (2020)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය :

ස්ථාවර දුරකථන අංකය :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේදී ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

07. 7.1 දැනට දරන තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් . . . . . . . ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* .- තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම :*

මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිලමුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*
1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

03-412/2

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2020)**

**First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2013 (2020)**

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2020 ජූනි මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටතේ වේ. විභාගය පැවත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු :* විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250/- ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500/- ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිඳු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත :* අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළයුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020 අප්‍රේල් මස 03 වැනි දිනට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

I. ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

06.01 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවවනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.02 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතුය.

06.03 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරඟ විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරඟ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරඟ විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | ➢ දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රමථ ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $X^2$ පරීක්ෂා ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රික ප්‍රවණතාව හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයන, විචලතාවය, චතුර්ථක හා සම්මත අපගමනය) නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාව, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br><br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 04 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛයන් පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br><br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 05 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 3 | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු. රෙ. 1 සිට 68 දක්වා)<br><br>➢ III වන පරිච්ඡේදය - මුල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව, ප්‍රධාන ගණක නිලධාරින්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරින් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br><br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 05 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

සටහන -

➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
➢ නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභාගය පැවත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිපවරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

14. මෙම ගැසට් නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරනු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්.
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,

සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දුව පාර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ෂෂ ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2020)**

First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics 2013 (2020)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය :

ස්ථාවර දුරකථන අංකය :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේදී ඉදිරිපත්වන විෂයය/විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

06. උපන් දිනය :
වර්ෂය  මාසය  දිනය

07. දැනට දරන :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් ............... ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

සටහන - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම :*

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... ......................... මයා/ මිය/ මෙනෙවිය ......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

03-412/1

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (2020)

1.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2020 මැයි මාසයේ දී පවත්වනු ලබන බවත්, ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. විභාග පැවැත්වෙන්නේ නියමිත නගරවල පමණක් වන අතර, අදළ නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම් පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්.*—2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව, ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය.*—අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. :

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය | 1 | 100 | පැය 01 1/2 | 40% |
| විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 2 | 100 | පැය 01 1/2 | 40% |

5.1 **කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය (විෂය අංකය - 01)**

කාර්යාල ක්‍රම :

රජයේ කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.

*රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය :*

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති අනුව විනය බලතල බෙදී ඇති ආකාරය, සේවය අවසන් කිරීම, විශ්‍රාම ගැන්වීමට අදාළ රීති හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සාමාන්‍ය හැසිරීම හා විනය ක්‍රියා පටිපාටියට අදාළ XLVII හා XLVIII පරිච්ඡේදයන්හි සඳහන් විධිවිධාන හා ඒ සම්බන්ධව තත්කාලීනව නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිබඳ ඇති දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :

I *වැනි කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි);

II *වැනි කොටස* - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පහටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි (ලකුණු 75 යි.)

5.2 **විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම (විෂය අංකය - 02)**

ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර එම විෂයයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යයනයෙන් සමන්විත වේ :-

I *වන කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි)

II *වන කොටස* - ප්‍රශ්න පහකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පහටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි. (ලකුණු 75 යි.)

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර, අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලුම විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මගින් 2020 මාර්තු මස 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "***විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ***" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'විභාගයේ නම' සඳහන් කළයුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුලු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11.0 *අයදුම්පත්.*—ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 6.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද, 7.0 ශීර්ෂයේ සිට දෙවන පිටුවට ද ඇතුළත්වන පරිදි ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක්වන අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 500 ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 250ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ම ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13.0 නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, විභාග ගාස්තු ගෙවීමට අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඔබගේ ඉල්ලීම් ලිපියක් එහි පිටපතක් ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාගයට අදළ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එස්. හෙට්ටිආරච්චි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
සහ පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 25 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
''නිල මැදුර''
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (2020)**
Efficiency Bar Examination for Officers in Class I Grama Niladhari Service — 2019 (2020)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| | *විභාගයට ඉල්ලුම් කරන නගරය* | *නගර අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(*ගැසට් නිවේදනයේ* 2.0 ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්ත අනුව අනුපිළිවෙලින් දක්වන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(*උද.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ( *උද.* :- GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.0 2.1 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික්ක අංකය :—————.
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.3 සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය :—————.
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය :

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.4 ජංගම දුරකථන අංකය :

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/විෂයයන් (*ගැසට් නිවේදනයේ* 05 වැනි ඡේදය බලන්න)

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |

5.0 5.1 අයත්වන ශ්‍රේණිය :—————.
5.2 තනතුර :—————.
5.3 අදාළ ශ්‍රේණියට පත්වීම ලද දිනය :—————.

6.0 ***සැළකිය යුතුයි.***— *ගැසට්* පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල්/උප තැපැල් කාර්යාලයෙන් අයදුම්කරුගේ නමින්ම ලබාගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

කුවිතාන්සි අංකය :—————.
තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
දිනය :—————.
මුදල රුපියල් :—————.

7.0 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. එසේම එම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත් වන බව ද/විභාග යට නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

**ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය**

................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............ ග්‍රාම නිලධාරි වසමේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරී/ග්‍රාම නිලධාරිණී, ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය විසින්,

(i) මා ඉදිරියේ දී අත්සන් කළ බවත්,
(ii) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(iii) නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,
(iv) පළමුවන වරට විභාගයට පෙනී සිටින බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

(නොගැලපෙන වචන කපා හරින්න)

—————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

**උපලේඛනය I**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| කොළඹ | 1103 | කොළඹ 01 |
| කොලොන්නාව | 1106 | |
| කඩුවෙල | 1109 | |
| හෝමාගම | 1112 | |
| හංවැල්ල | 1115 | |
| පාදුක්ක | 1118 | |
| මහරගම | 1121 | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | |
| තිඹිරිගස්යාය | 1127 | |
| දෙහිවල | 1130 | |
| රත්මලාන | 1131 | |
| මොරටුව | 1133 | |
| කැස්බෑව | 1136 | |
| මීගමුව | 1203 | ගම්පහ 02 |
| කටාන | 1206 | |
| දිවුලපිටිය | 1209 | |
| මීරිගම | 1212 | |
| මිනුවන්ගොඩ | 1215 | |
| වත්තල | 1218 | |
| ජාඇල | 1221 | |
| ගම්පහ | 1224 | |
| අත්තනගල්ල | 1227 | |
| දොම්පේ | 1230 | |
| මහර | 1233 | |
| කැළණිය | 1236 | |
| බියගම | 1239 | |
| පානදුර | 1303 | කළුතර 03 |
| බණ්ඩාරගම | 1306 | |
| හොරණ | 1309 | |
| ඉංගිරිය | 1310 | |
| බුලත්සිංහල | 1312 | |
| මදුරාවල | 1315 | |
| මිල්ලනිය | 1318 | |
| කළුතර | 1321 | |
| බේරුවල | 1324 | |
| දොඩන්ගොඩ | 1327 | |
| මතුගම | 1330 | |
| අගලවත්ත | 1333 | |
| පාලින්දනුවර | 1336 | |
| වලල්ලාවිට | 1339 | |
| තුම්පනේ | 2103 | මහනුවර 04 |
| පූජාපිටිය | 2106 | |
| අකුරණ | 2109 | |
| පාතදුම්බර | 2112 | |
| පන්විල | 2115 | |
| උඩුදුම්බර | 2118 | |
| මිනිපේ | 2121 | |
| මැදදුම්බර | 2124 | මහනුවර 04 |
| කුණ්ඩසාලේ | 2127 | |
| ගඟවට කෝරළේ | 2130 | |
| හාරිස්පත්තුව | 2133 | |
| හතරලියද්ද | 2134 | |
| යටිනුවර | 2136 | |
| උඩුනුවර | 2139 | |
| දොළුව | 2142 | |
| පාතහේවාහැට | 2145 | |
| දෙල්තොට | 2148 | |
| උඩපළාත | 2151 | |
| ගඟඉහල කෝරළේ | 2154 | |
| පස්බාගෙ කෝරළේ | 2157 | |
| ගලේවෙල | 2203 | මාතලේ 05 |
| දඹුල්ල | 2206 | |
| නාඋල | 2209 | |
| පල්ලෙපොල | 2212 | |
| යටවත්ත | 2215 | |
| මාතලේ | 2218 | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | |
| ලග්ගල පල්ලේගම | 2224 | |
| විල්ගමුව | 2227 | |
| රත්තොට | 2230 | |
| උකුවෙල | 2233 | |
| කොත්මලේ | 2303 | නුවරඑළිය 06 |
| හඟුරන්කෙත | 2306 | |
| වලපනේ | 2309 | |
| නුවරඑළිය | 2312 | |
| අඹගමුව | 2315 | |
| බෙන්තොට | 3103 | ගාල්ල 07 |
| බලපිටිය | 3106 | |
| කරන්දෙනිය | 3109 | |
| ඇල්පිටිය | 3112 | |
| නියාගම | 3115 | |
| තවලම | 3118 | |
| නෙළුව | 3121 | |
| නාගොඩ | 3124 | |
| බද්දේගම | 3127 | |
| වැලිවිටිය දිවිතුර | 3130 | |
| අම්බලන්ගොඩ | 3133 | |
| හික්කඩුව | 3136 | |
| කඩවත්සතර | 3139 | |
| බෝපෙ පෝද්දල | 3142 | |
| අක්මීමන | 3145 | |
| යක්කලමුල්ල | 3148 | |
| ඉමදූව | 3151 | |
| ගෝනපීනුවල | 3154 | |
| හබරාදුව | 3157 | |
| පිටබැද්දර | 3203 | මාතර 08 |
| කොටපොල | 3206 | |
| පස්ගොඩ | 3209 | |
| මුලටියන | 3212 | |
| අතුරලිය | 3215 | |
| අකුරැස්ස | 3218 | |
| වැලිපිටිය | 3221 | |
| මාලිම්බඩ | 3224 | |
| කඹුරුපිටිය | 3227 | |
| හක්මන | 3230 | |
| කිරින්ද පුහුල්වැල්ල | 3233 | |
| තිහගොඩ | 3236 | |
| වැලිගම | 3239 | |
| මාතර | 3242 | |
| දෙවිනුවර | 3245 | |
| දික්වැල්ල | 3248 | |
| සූරියවැව | 3303 | හම්බන්තොට 09 |
| ලුණුගම්වෙහෙර | 3306 | |
| තිස්සමහාරාමය | 3309 | |
| හම්බන්තොට | 3312 | |
| අම්බලන්තොට | 3315 | |
| අඟුණකොලපැලැස්ස | 3318 | |
| වීරකැටිය | 3321 | |
| කටුවන | 3324 | |
| ඕකේවෙල | 3327 | |
| බෙලිඅත්ත | 3330 | |
| තංගල්ල | 3333 | |
| වලස්මුල්ල | 3336 | |
| කයිට්ස් | 4103 | යාපනය 10 |
| චාවක්කනි | 4106 | |
| සන්දිලිපායි | 4109 | |
| තෙලිප්පායි | 4112 | |
| උඩුවිල් | 4115 | |
| කෝපායි | 4118 | |
| කරවෙඩ්ඩි | 4121 | |
| මුරුතන්කර්නි | 4124 | |
| පොයින්ට් පේද්‍රුරු | 4127 | |
| චාවාකච්චේරි | 4130 | |
| නල්ලූර් | 4133 | |
| යාපනය | 4136 | |
| වෙලනායි | 4139 | |
| ඩෙල්ෆ් | 4142 | |
| කරෙයිනගර් | 4145 | |
| මන්නාරම | 4203 | මන්නාරම 11 |
| මාන්තායි බටහිර | 4206 | |
| මඩු | 4209 | |
| නානද්දාන් | 4212 | |
| මුසාලි | 4215 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| වවුනියා උතුර | 4303 | වවුනියා 12 |
| වවුනියා දකුණ | 4306 | |
| වවුනියා | 4309 | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | |
| තුනුක්කායි | 4403 | මුලතිව් 13 |
| මාන්තායි නැගෙනහිර | 4406 | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | |
| මැරිටයිම්පත්තු | 4415 | |
| වැලිඔය | 4418 | |
| පච්චිලෙයිපල්ලි | 4503 | කිලිනොච්චිය 14 |
| කඳවලෙයි | 4506 | |
| කරච්චි | 4509 | |
| පූනාකරි | 4512 | |
| කෝරළේපත්තු උතුර | 5103 | මඩකලපුව 15 |
| කෝරළේපත්තු බටහිර | 5106 | |
| කෝරළේපත්තු | 5109 | |
| එරාවුර්පත්තු | 5112 | |
| එරාවුර් නගරය | 5115 | |
| මන්මුනේ උතුර | 5118 | |
| මන්මුනේ බටහිර | 5121 | |
| කාත්තන්කුඩි | 5124 | |
| මන්මුනේපත්තු | 5127 | |
| මන්මුනේ නිරිත | 5130 | |
| පෝර්තිව්පත්තු | 5133 | |
| මන්මුනේ දකුණ | 5136 | |
| කෝරළේපත්තු දකුණ | 5139 | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | අම්පාර 16 |
| පදියතලාව | 5206 | |
| මහඔය | 5209 | |
| උහන | 5212 | |
| අම්පාර | 5215 | |
| නාවින්දවේලි | 5216 | |
| සමන්තුරෙයි | 5218 | |
| කල්මුණේ දමිල | 5224 | |
| සයින්ද මරුදු | 5225 | |
| කාර්තිවු | 5227 | |
| නින්දවූර් | 5230 | |
| අඩ්ඩාලච්චේන | 5233 | |
| ඉරක්කාමම් | 5234 | |
| අක්කරපත්තුව | 5236 | |
| අලයඩිවෙම්බු | 5239 | |
| දමන | 5242 | |
| තිරුක්කෝවිල් | 5245 | |
| පොතුවිල් | 5248 | |
| ලාහුගල | 5251 | |
| කල්මුණේ මුස්ලිම් | 5254 | |
| පදවි ශ්‍රී පුර | 5303 | ත්‍රිකුණාමලය 17 |
| කුච්චවේලි | 5306 | |
| ගෝමරන්කඩවල | 5309 | |
| මොරවැව | 5312 | |
| නගර හා කඩවත් | 5315 | |
| තඹලගමුව | 5318 | |
| කන්තලේ | 5321 | |
| කින්නියා | 5324 | |
| මුතූර් | 5327 | |
| සේරුවිල | 5330 | |
| වෙරුගල්/ඉච්චලම්පත්තු | 5333 | |
| ගිරිබාව | 6103 | කුරුණෑගල 18 |
| ගල්ගමුව | 6106 | |
| ඇහැටුවැව | 6109 | |
| අඹන්පොල | 6112 | |
| කොටවෙහෙර | 6115 | |
| රස්නායකපුර | 6118 | |
| නිකවැරටිය | 6121 | |
| මහව | 6124 | |
| පොල්පිතිගම | 6127 | |
| ඉබ්බාගමුව | 6130 | |
| ගනේවත්ත | 6133 | |
| වාරියපොල | 6136 | |
| කොබෙයිගනේ | 6139 | |
| බිංගිරිය | 6142 | |
| බමුණාකොටුව | 6149 | |
| මාස්පොත | 6151 | |
| කුරුණෑගල | 6154 | |
| මල්ලවපිටිය | 6157 | |
| මාවතගම | 6160 | |
| රිදීගම | 6163 | |
| වීරඹුගෙදර | 6166 | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | |
| කුලියාපිටිය බටහිර | 6172 | |
| උඩුබද්දාව | 6175 | |
| පන්නල | 6178 | |
| නාරම්මල | 6181 | |
| අලව්ව | 6184 | |
| පොල්ගහවෙල | 6187 | |
| පඬුවස්නුවර නැගෙනහිර | 6190 | |
| පඬුවස්නුවර බටහිර | 6193 | |
| කල්පිටිය | 6203 | පුත්තලම 19 |
| වනාතවිල්ලුව | 6206 | |
| කරුවලගස්වැව | 6209 | |
| නවගත්තේගම | 6212 | |
| පුත්තලම | 6215 | |
| මුන්දලම | 6218 | |
| මහකුඹුක්කඩවල | 6221 | |
| ආණමඩුව | 6224 | |
| පල්ලම | 6227 | |
| ආරච්චිකට්ටුව | 6230 | |
| හලාවත | 6233 | |
| මාදම්පෙ | 6236 | |
| මහවැව | 6239 | |
| නාත්තන්ඩිය | 6242 | |
| වෙන්නප්පුව | 6245 | |
| දංකොටුව | 6248 | |
| පදවිය | 7103 | අනුරාධපුරය 20 |
| කැබිතිගොල්ලෑව | 7106 | |
| මැදවච්චිය | 7109 | |
| මහවිලච්චිය | 7112 | |
| මධ්‍යම නුවරගම්පළාත | 7115 | |
| රඹෑව | 7118 | |
| කහටගස්දිගිලිය | 7121 | |
| හොරොව්පතාන | 7124 | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | |
| මිහින්තලේ | 7130 | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | |
| නාච්චදූව | 7136 | |
| නොච්චියාගම | 7139 | |
| රාජාංගනය | 7142 | |
| තඹුත්තේගම | 7145 | |
| තලාව | 7148 | |
| තිරප්පනේ | 7151 | |
| කැකිරාව | 7154 | |
| පළුගස්වැව | 7157 | |
| ඉපලෝගම | 7160 | |
| ගල්නෑව | 7163 | |
| පලාගල | 7166 | |
| හිඟුරක්ගොඩ | 7203 | පොළොන්නරුව 21 |
| මැදිරිගිරිය | 7206 | |
| ලංකාපුර | 7209 | |
| වැලිකන්ද | 7210 | |
| දිඹුලාගල | 7212 | |
| තමන්කඩුව | 7215 | |
| ඇලහැර | 7218 | |
| මහියංගනය | 8103 | බදුල්ල 22 |
| රිදීමාලියද්ද | 8106 | |
| මීගහකිවුල | 8109 | |
| කන්දෙකැටිය | 8112 | |
| සොරණාතොට | 8115 | |
| පස්සර | 8118 | |
| ලුණුගල | 8119 | |
| බදුල්ල | 8121 | |
| හාලිඇල | 8124 | |
| ඌව පරණගම | 8127 | |
| වැලිමඩ | 8130 | |
| බණ්ඩාරවෙල | 8133 | |
| ඇල්ල | 8136 | |
| හපුතලේ | 8139 | |
| හල්දුම්මල | 8142 | |
| බිබිල | 8203 | මොණරාගල 23 |
| මඩුල්ල | 8206 | |
| මැදගම | 8209 | |
| සියඹලාණ්ඩුව | 8212 | |
| මොණරාගල | 8215 | |
| බඩල්කුඹුර | 8218 | |
| බුත්තල | 8221 | |
| වැල්ලවාය | 8224 | |
| කතරගම | 8227 | |
| තණමල්විල | 8230 | |
| සෙවනගල | 8233 | |
| ඇහැලියගොඩ | 9103 | රත්නපුර 24 |
| කුරුවිට | 9106 | |
| කිරිඇල්ල | 9109 | |
| රත්නපුර | 9112 | |
| ඉඹුල්පෙ | 9115 | |
| බලංගොඩ | 9118 | |
| ඕපනායක | 9121 | |
| පැල්මඩුල්ල | 9124 | |
| ඇලපාත | 9127 | |
| අයගම | 9130 | |
| කලවාන | 9133 | |
| නිවිතිගල | 9136 | |
| කහවත්ත | 9139 | |
| ගොඩකවෙල | 9142 | |
| වැලිගෙපොල | 9145 | |
| ඇඹිලිපිටිය | 9148 | |
| කොලොන්න | 9151 | |
| රඹුක්කන | 9203 | කෑගල්ල 25 |
| මාවනැල්ල | 9206 | |
| අරණායක | 9209 | |
| කෑගල්ල | 9212 | |
| ගලිගමුව | 9215 | |
| වරකාපොල | 9218 | |
| රුවන්වැල්ල | 9221 | |
| බුලත්කොහුපිටිය | 9224 | |
| යටියන්තොට | 9227 | |
| දෙහිඕවිට | 9230 | |
| දැරණියගල | 9233 | |

03-443

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුදා දිනට පෙර දැනුම් දිය යුතුය.**

I (IIඅ) ඡෙදය යටතේ පළවන ඉතිරි දැන්වීම් සහ I කොටස : (IIආ) ඡේදය හා I කොටස :I කොටස යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2020.03.06 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk